**ශීර්ෂය 148 - සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශය**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ඔක්තෝබර් 8 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ)උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැක. තවද, ඒ හේතුවෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ මෙම වාර්තාවට ඉදිරිපත් කර නැත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1. ගිණුම් ඉදිරිපත් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**<br>2018 නොවැම්බර් 21 දිනැති අංක 2018/267 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එය මාස 02යි දින 15ක ප්‍රමාදයකින් පසු 2019 මැයි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | වැය ශීර්ෂයක් වෙන් කිරීම, ප්‍රතිපාදන ලබා ගැනීම හා ගිණුම් ගත කිරීම පිළිබඳ උපදෙස් වර්ෂය අවසාන වනතුරු නොලැබීම සහ ප්‍රමාණවත් පුහුණු නිලධාරීන් නොමැතිවීමෙන් නියමිත දිනයට වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව |
| **(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය**<br>2017 ජූලි 05 දිනැති අංක 2017/256 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව විෂය අංක 14801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2018 නොවැම්බර් 21 දිනැති අංක 2018/267 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එය මාස 02යි දින 15 ක ප්‍රමාදයකින් පසුව 2019 මැයි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි . | -එම- | -එම- |

**1.6.2. පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 මාර්තු 23 දිනැති අංක 2064/26 දරන ගැසට් පත්‍රය මගින් ශීර්ෂ 148 - සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශය අහෝසිකර තිබුණු බැවින් එම අමාත්‍යාංශයට අදාලව එදින දක්වා වූ ගනුදෙනු මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. අළුතින් පිහිටුවන ලද ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයට අදාල වියදම් පියවීම සඳහා ලබාදී තිබූ රු.මිලියන 50 ක් හා තවත් රු.මිලියන 195 ක ප්‍රතිපාදනද මෙම වැය ශීර්ෂය සඳහා ලබාදී තිබුණද එම තත්ත්වය ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියළුම වැදගත් කරුණු ගිණුම් සටහන් මගින් හෙළිදරව් කළ යුතුවීම. | මේ සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම මූල්‍ය ප්‍රකාශන සඳහා වන පෝරම අංක ACA-2(ii) යටතේ දක්වා ඇති බව. |

**1.6.3. මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

2018 නොවැම්බර් 21 දිනැති අංක 2018/267දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අවස්ථා පහත පරිදි විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) චක්‍රලේඛයේ 7(IV) ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන දේපල, පිරියත හා උපකරණ වටිනාකමට සමානව ශුද්ධ වත්කම් යටතේ සංචිත දක්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවීම. | ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ භාණ්ඩාගාරයට අදාල ශුද්ධ වත්කම් යටතේ පෙන්වා ඇති බව |
| (ආ) චක්‍රලේඛයේ 7(VI) ඡේදය ප්‍රකාරව අක් මුදල් ගැලපීම් ගිණුමක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත්කර නොතිබුණි | -එම- | වර්ෂය අවසානයේ භාණ්ඩාගාරයට පියවිය යුතු අගය සැසඳීම සඳහා සැසඳුම් ප්‍රකාශයක් ACA-3 පෝරමය අනුව දක්වා ඇති බව. |

**1.6.4. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ වියදම් සඳහා අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ලැබී තිබුණු රු.මිලියන 50 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට වැයකර තිබුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 ව්‍යවස්ථාවට අනුව හා මු.රෙ. 78(අ)(3) ප්‍රකාරව මෙම අත්තිකාරම් මුදල සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව මගින් අනුමත කරවා ගෙන කඩිනමින් පියවීමට කටයුතු කළ යුතු වුවත් 2019 මැයි වනවිටත් එය පියවා නොතිබුණි. මේ හේතුවෙන් වැය කර තිබූ මුදල සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්වල ඇතුළත් වී නොතිබුණි. තවද, මෙම අත්තිකාරම් ආදායම් නොවන ලැබීම් ලෙස නොදක්වා භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් ලෙස දක්වා තිබුණි. | අවිනිශ්චිත අවස්ථා අරමුදලේ අත්තිකාරම් ලැබීම් පොදු තැන්පත් ගිණුම හරහා ලැබෙන බැවින් එම වටිනාකම පොදු තැන්පත් ලැබීමක් ලෙස ගිණුම්ගත කළ යුතුවීම. | අවිනිශ්චිත අවශ්‍යතා අරමුදල යටතේ පොදු තැන්පත් ගිණුමට ලද මුදල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පත් ලැබීමක් ලෙස පෙන්වා නැති බවද, අවිනිශ්චිත අවශ්‍යතා අරමුදලෙන් දරන ලද වියදම ගිණුම්ගත කිරීමට ප්‍රතිපාදන ලැබුණු පසු, එය ගිණුම්ගත කරන අවස්ථාවේ පෙන්විය හැකි බව |
| (ආ) | භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂයට අදාලව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමට වූ මුළු ලැබීම් රු.මිලියන 3.52 ක් හා ගෙවීම් රු.මිලියන 9.16 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.මිලියන 0.85 ක් හා රු.මිලියන 3.15 ක් ලෙස දැක්වීම හේතුවෙන් පිළිවෙලින් රු.මිලියන 2.67 ක් හා රු.මිලියන 6.01 ක් | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමට අමාත්‍යාංශය මගින් අයකර ගනු ලබන හා භාණ්ඩාගාරය විසින් වැය ශීර්ෂය වෙත ඍජුවම අයකරගනු ලබන සියළුම මුදල් අත්තිකාරම් ලැබීම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දැක්විය යුතුවීම . | රු.2,667,194 ක් මුදලින් ලැබී නොමැති අතර එය හුදෙක් ගිණුම් අතර හරස් සටහන් ලෙස මාරු කිරීමක් බවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සඳහන් කරන ලද්දේ මුදලින් ලද මුදල් පමණක් බවද, එම විස්තර ACA-05 පෝරමය යටතේ දක්වා ඇති බව. |

අඩුවෙන් දැක්වුණි.

### 1.6.5 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාලව දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම රු.මිලියන 3.84ක් වුවද එය භාණ්ඩාගාර පොත් සමඟ සසඳා නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කළ යුතුවීම. | ශීර්ෂයක් වෙන් කර නොතිබීම නිසා එම වර්ෂයේ මෙම වටිනාකම් ගිණුම්ගත කිරීමට අපොහොසත් වූයෙන් එම ශේෂයන් භාණ්ඩාගාර පොත්වල නිරීක්ෂණය නොවන බව. |
| (ආ) | වෙනත් ආයතන විසින් මෙම අමාත්‍යාංශය වෙත පවරා දී ඇති දැනට භාවිතයේ පවතින හා අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් රු.මිලියන 1.72 ක් වටිනා ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ආයතනයට අයත් සියළුම ස්ථාවර වත්කම්වල වටිනාකම තක්සේරුකර ගිණුම්වල දැක්විය යුතුවීම. | 2018 වර්ෂය අවසානවන තෙක්ම අදාළ ගණුදෙනු ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය උපදෙස් නොලැබීම හේතුවෙන් ගිණුම්ගත කර නොමැති බව |

### 1.6.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ශුද්ධ මුදල්වල වෙනස්වීම ශූන්‍ය විය යුතු වුවත් එය රු.මිලියන 51.14 ක් ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුවීම. | අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ලබාදුන් මුදලට අදාල වියදම් ලේඛන ගත කිරීමට ප්‍රතිපාදන ලබානොදීම. |

### 1.6.7 තැන්පතු ලැබීම් හා ගෙවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ වියදම් සඳහා අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ලැබීම් සඳහා වූ පොදු තැන්පත් ගිණුමට අදාල නොවන රු.196,889 ක් වූ වෙනත් තැන්පත් ලැබීම් හා රු.336,441ක් වූ තැන්පතු ගෙවීම් එම තැන්පත් ගිණුමේ ඇතුළත් කර තිබුණි. | පොදු තැන්පත් ගිණුමට අදාල ලැබීම් හා ගෙවීම් පමණක් ඇතුළත් කළ යුතුවීම | තරුණ කටයුතු, ව්‍යාපෘති කළමණාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයට ශීර්ෂයක් නොමැති වීම සහ ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර නොතිබූ නිසා පොදු තැන්පත් ගිණුමක් විවෘත කිරීම ප්‍රායෝගික ගැටළුවක් වීම නිසා තැන්පත් ගිණුමක් විවෘත කිරීමට නොහැකි වූ බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව පොදු තැන්පත් ගිණුමේ මුළු ලැබීම් රු.මිලියන 50.19ක් වූ අතර ගෙවීම් රු.මිලියන 50.33ක් වූයෙන් ලැබීම් ඉක්මවා රු.මිලියන 0.14 ක් ගෙවා තිබුණි | පොදු තැන්පත් ගිණුමේ ලැබීම්වලට සමාන මුදලක් පමණක් ගෙවීම් කළ යුතුවීම. | - එම - |

### 1.6.8 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 1.18 ක් වූ අග්‍රිම ශේෂය භාණ්ඩාගාරය වෙත පියවා තිබුණද භාණ්ඩාගාර පොත් අනුව එය තවදුරටත් පියවියයුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි | භාණ්ඩාගාර පොත් සමග සසඳා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම | භාණ්ඩාගාර මුද්‍රිතවල පෙන්නුම් කරනුයේ 2018 දෙසැම්බර් 31 දිනට පිය විය යුතු මුදල වන අතර එය 2018 දෙසැම්බර් 31 පියවීම සිදු කර ඇති බව |

### 1.6.9 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 84 වගන්තිය ප්‍රකාරව 2018 අප්‍රේල් 01 දිනෙන් පසු සේවා ගාස්තු හා කොන්ත්‍රාත් ගෙවීම්වලින් සියයට | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 84 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 84 වන වගන්තිය තුළ මූල්‍ය කල්බදු පහසුකම් |

| | | |
|---|---|---|
| 10 ක රඳවා ගැනීම් බදු අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් සේවා ගිවිසුම් 03 කට අදාල ගෙවීම් මත රු.මිලියන 2.56 ක් අඩු කර ගැනීමකින් තොරව සම්පූර්ණ මුදලම අදාල පාර්ශව වෙත ගෙවා තිබුණි. | | සඳහා රඳවා ගැනීමේ බදු අඩු කිරීමක් පිළිබඳව සඳහන් නොවන බැවින් ඉහත සේවා ගිවිසුම්වලට අදාළව එසේ රඳවා ගැනීමේ බදු අඩු කිරීමක් අවශ්‍ය නොවන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ප්‍රාග්ධන වැය විෂයයන් 05කට අදාලව වෙන් කළ ප්‍රතිපාදනවලින් සියයට 41 සිට සියයට 100 ක් දක්වා පරාසයක් තුළ එකතුව රු.මිලියන 3.52 ක්ද, පුනරාවර්ථන වැය විෂයයන් 28 කට අදාලව සියයට 5 සිට සියයට 100 දක්වා පරාසයක් තුළ එකතුව රු.මිලියන 35.61 ක් ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 39.14 ක් උපයෝජනය කර නොතිබුණි. එම ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28ක් විය. | සැලසුම්කළ පරිදි ප්‍රතිපාදන වැය කිරීමට කටයුතු කළ යුතුවීම. | අපේක්ෂා කළ පරිදි වියදම් නිසි පරිදි කළමනාකරණය කිරීමට නොහැකි වු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| පසුගාමී ප්‍රදේශ සංවර්ධන වැඩසටහන යටතේ 2018 අයවැය ඇස්තමේන්තුව මගින් රු. මිලියන 1,000ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඉන් රු.මිලියන 476ක් හෙවත් | සමාලෝචිත වර්ෂය අවසන් දිනට නිම කිරීමට සැලසුම්කරන ලද ව්‍යාපෘති සියල්ල නිම කිරීමට කටයුතු කළ යුතුවීම. | 2018 වසරේදී රු.මි. 1000 ක ප්‍රතිපාදන වෙන් කළ නමුත් ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් ලබා දුන් වාචික උපදෙස් පරිදී වැඩසටහන සඳහා වෙන් කළ |

| | | |
|---|---|---|
| සියයට 48ක් පමණක් ලබාදීමට අනුමත කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති 289ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 11 ක් තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණි. සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශය 2018 මාර්තු මාසයේ සිට අහෝසිවී තිබුණද මෙම විෂයය අයත්ව තිබූ ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය මගින් එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය අවසන් වනතෙක් අඛණ්ඩව ක්‍රියාත්මක කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වනවිටඑම ව්‍යාපෘති අතුරින් ව්‍යාපෘති 115 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර සැලසුම්කරන ලද ව්‍යාපෘති 174 ක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට වූ ප්‍රගති වාර්තා අනුව ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 123ක් වූ අතර එය අනුමත කළ මුදලින් සියයට 26ක් විය. | | ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 500ට සීමා කළ බවද, ඒ අනුව දිස්ත්‍රික් 11 සඳහා රු.මි.475.84 ක වටිනාකමකින් යුත් ව්‍යාපෘති 287 ක් අනුමත කර ඉන් ව්‍යාපෘති 118 ක් පමණක් ක්‍රියාත්මක කළ බව හා එම ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල 2018 දෙසැම්බර්31 දිනට මූල්‍ය ප්‍රගතිය රු.මි.121.97 ක් විය. ඒ වන විට අතැති බිල් සහ ගිවිසුම් ගතවී අවිච්ඡේද ලෙස අනුමැතිය ඉල්ලා තිබූ ව්‍යාපෘති වල වටිනාකම රු.මිලියන 126.72ක් වීමෙන් ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 248.69 ක් වූ බව |

## 3.2 වත්කම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජූනි හා ඔක්තෝබර් මාසවලදී මිලදීගෙන තිබුණු රු.112,240ක් වටිනා ෆැක්ස් යන්ත්‍ර 04 ක්, එකක් රු.124,740ක් වටිනා පරිගණක මුද්‍රණ යන්ත්‍ර 06 ක් හා රු.79,500 ක් වූ රූපවාහිනී යන්ත්‍ර 01 ක් 2019 මැයි වනවිටත් භාවිතයට නොගෙන | අවශ්‍යතාවය නිශ්චිතව හඳුනා ගෙන මිලදී ගතයුතු අතර, ඒවා අවශ්‍ය ස්ථානවලට නොපමාව නිකුත් කිරීමට කටයුතු කළ යුතුවිම. | මෙම ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඉල්ලුම් කරනු ලබන අංශයන් වෙත නිකුත් කිරීමට කටයුතු කරන බව. |

ගබඩාවේ තබා තිබුණි.

### 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු කිසිදු නිලධාරියකු ඇප තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 හි විධිවිධාන පරිදි කටයුතු කළ යුතුවීම. | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් එම ඇප ලබා ගැනීමේ කටයුතු ඉදිරියේ දී සම්පූර්ණ කිරීමට සටහන් කර ගත්බව. |

### 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති තරුණ කටයුතු අංශයට රියදුරන් 18 දෙනෙකු අනුයුක්ත කර තිබුණද එම අවස්ථාව වන විට අංශය සතුව වාහන 06 ක් පමණක් පැවතුණි. අතිරික්ත රියදුරන් 12 ක් වෙනුවෙන් 2018 නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී වැටුප් වශයෙන් පමණක් රු.903,972 ක් ගෙවා තිබුණි. | සේවා අවශ්‍යතාවය මත පමණක් සේවකයින් බඳවාගත යුතුවීම. | ව්‍යාපෘති කළමනාකාර හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයේ රියදුරු පුරප්පාඩු පැවති බැවින් රියදුරන් බඳවා ගන්නා ලදි . |
| (ආ) වෙනත් රාජ්‍ය ආයතන විසින් සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශය වෙත පවරා දී තිබූ, හා පසුව ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය විසින්ද භාවිතා කරන ලද වාහන 06 ක් අදාල ආයතනවලින් පවරා ගෙන | වාහන වල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවීම. | අමාත්‍යාංශය වෙත පවරා ගෙන නොතිබූ බව. |

නොතිබුණි.

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම. |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව අමාත්‍යාංශය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත්වී නොතිබුණි. | අදාල "න්‍යාය පත්‍රය" අනුව ඉලක්ක අත්පත් කර ගැනීමට සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු සැලසුම් කළ යුතුවීම. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, යෞවන කටයුතු අංශයේ කාර්යභාරය පිළිබඳ සෑම නිලධාරියෙකුම දැනුවත් කර තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට අදාළව රාජකාරි ලැයිස්තු පවරා දී ඇති බව. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(I) ප්‍රකාරව අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණන සැලැස්මක් පිලියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විගණන සැළසුමක් පිළියෙල කිරීමට නොහැකි වූ බව. |

**5.2 විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(I) හා DMA/2009(I)(i) ප්‍රකාරව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව. |

වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත් 2018 වර්ෂයට අදාලව එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි